ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

**<u>ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් 20 දෙනෙකුට ඉන්දියාවේ හින්දි භාෂාව ඉගෙන ගැනීමට ශිෂ්‍යත්ව</u>**

ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් 20 දෙනෙකු ඉන්දිය රජයේ “හින්දි භාෂාව විදේශයන්හි ප්‍රචලිත කිරීම” යන වැඩසටහන යටතේ ඉන්දියාවේ හින්දි භාෂාව ඉගෙන ගැනීම සඳහා තෝරා ගෙන ඇත. මෙම පාඨමාලාව 2026 අගෝස්තු සිට 2027 මැයි දක්වා මාස 10ක් පුරා අග්‍රා හි කේන්ද්‍රීය හින්දි සංස්ථාන් හිදී පැවැත්වෙන අතර ඉන්දිය රජය ඔවුන්ගේ ගුවන් ටිකට්පත්, අධ්‍යයන ගාස්තු සහ දේශීය ආගන්තුක සත්කාර සඳහා අනුග්‍රාහකත්වය දරනු ඇත.

2. 2026 අගෝස්තු 4 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා මෙම සිසු සිසුවියන් ඉන්දියාවට පිටත් වීමට පෙරාතුව හමු විය. මහ කොමසාරිස්තුමා මෙහිදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහශ්‍ර වර්ෂ ගණනාවක් පුරා පවතින සංස්කෘතික, භාෂාමය සහ ආධ්‍යාත්මික සබඳතාවය ශක්තිමත් කිරීමෙහි ලා හින්දි භාෂාවේ සහ සාහිත්‍යයේ කාර්යභාරය පෙන්වා දුන්නේය. හින්දි සහ සිංහල වචනවල සබඳතා සහ ඒවායේ ප්‍රභවයන් පිළිබඳව ද සාකච්ඡා කරන ලදී. මහ කොමසාරිස්තුමා ඉන්දියාවේ අධ්‍යාපනය ලැබීම සඳහා පිටත්ව යන ශිෂ්‍යත්වලාභීන්ට සිය සුබ පැතුම් ද පිරිනැමුවේය.

3. තෝරා ගන්නා ලද සිසුන් අතරට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් එක් සිසුවෙකු ද, රුහුණු විශ්ව විද්‍යාලයෙන් සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයෙන් එක් සිසුවෙකු බැගින් ද අනුරාධපුර රජරට විශ්ව

විද්‍යාලයේ සිසුන් තිදෙනෙකු ද කැලණිය විශ්ව විද්‍යාලයේ සිසුන් අට දෙනෙකු ද ඇතුළත් විය.

4. ශ්‍රී ලංකාවේ සිසුන් සහ ජනතාව අතර හින්දි භාෂාව සඳහා මහත් කැමැත්තක් පවතින අතර ප්‍රමුඛ පෙළේ පාසල් සහ විශ්ව විද්‍යාල ඇතුළු ආයතන 100ක පමණ හින්දි භාෂාව උගන්වනු ලබයි.

5. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය 2011 වසරේ සිට මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලබයි. පසුගිය වසර 14 තුළ, ශ්‍රී ලංකාවේ සිසු සිසුවියන් 200කට අධික පිරිසකට මෙම වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව ලබා දී ඇත. හින්දි භාෂාව, සාහිත්‍යය සහ සිනමාව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඉපැරණි ශිෂ්ටාචාරමය සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමෙහි ලා වැදගත් භූමිකාවක් ඉටු කරයි.

***

**කොළඹ**

***2026* අගෝස්තු *07***